# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල**

**පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2019**

2014 නොවැම්බර් 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති තනතුර සඳහා වන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 2019.05.08 දිනැති සංශෝධිත පත්‍රිකා අංක 01 හි විධිවිධාන අනුව සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.0** මෙම විභාගය රත්නපුර නගරය තුළ පමණක් පැවැත්වේ.මෙම විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වෙන දිනය යථා කාලයේදී දන්වනු ඇත. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව කුසලතාවය මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්,රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධානයන් අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත,රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක දෙකෙන් ඉහලම කුසලතා අනුපිළිවෙල අනුව සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියේ තනතුරට සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

**2.0** පුස්තකාලයාධිපති තනතුර සඳහා වන මුළු පුරප්පාඩු සංඛ්‍යාව 27 කි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.1 හි විධිවිධාන හා සටහනට අනුව විවෘත තරඟ විභාගය මගින් 70% ක් (19) සම්පූර්ණ කරන අතර 30%ක් (08) සීමිත තරඟ විභාගය මගින් සම්පූර්ණ කරනු ලබන අතර, ඉදිරි වසර 02 ක් තුළ ඇතිවන පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මෙම තරඟ විභාගය අදාලවේ. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. සීමිත තරඟ විභාගය මගින් පිරවීමට නියමිත පුරප්පාඩු වලට ප්‍රමාණවත් අයදුම්කරුවන් නොසිටින්නේ නම් එම පුරප්පාඩුද,මෙම විවෘත විභාගයේ ප්‍රතිඵල අනුව කුසලතා අනුපිලිවෙලට පුරවනු ලැබේ. මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම මෙම කොමිෂන් සභාව සතුවේ.

**3.0** වැටුප : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයට අනුව සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 3-2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 31,040- 10×445- 11×660-10×730-10×750- රු.57,550/- වේ.(ඉහත චක්‍ර ලේඛයේ II වන උප ලේඛනය අනුව වැටුප් ගෙවීම සිදුකෙරේ)

**4.0** මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.එහෙත් විශ්‍රාම වැටුප් සම්බන්ධව 2016.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් වනු ඇත.

**5.0** **සුදුසුකම්** :- සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාල වේ.

(අ) සබරගමුව පළාත් බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකා පුරවැසියකු වීම : අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්ව වසර 03ක් අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ඇ) (i) මවුබස(සිංහල/ දෙමළ / ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 6 කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

සහ

(ii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියළුම විෂයයන්ගෙන් සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය(ඉංග්‍රීසි හැර )එකවර සමත්ව තිබීම.(පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

සහ

(ඈ) (i) පිලිගත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යා විඥාපන පිළිබඳ තුන් (03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

හෝ

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් (03) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

හෝ

(iii) පුස්තකාල විද්‍යාව පිළිබඳව ඉහත (i) හෝ (ii) සුදුසුකම් වලට වඩා ඉහල සුදුසුකමක් ලබා තිබීම.

**සටහන :**

(i) පුස්තකාල විද්‍යා විඥාපන පිළිබඳ තුන් (03) අවුරුදු ඩිප්ලෝමාව හදාරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පමණක් පුස්තකාල විද්‍යා විඥාපන පිළිබඳ උපාධියක් හදාරා ඇති ( විෂයයක් ලෙස නොව ) අයදුම්කරුවන් පිළිබඳ සලකා බලනු ලැබේ. එහෙත් මෙම තනතුර සඳහා වන වැටුප උපාධිධාරීන් සඳහා වන වැටුප් ක්‍රමය නොවන බවද සැලකිය යුතුය.

(ii) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියළු සුදුසුකම් 2019 ජූනි මස 27 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

## 6.0 විභාග පරිපාටිය :

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය පහත පරිදි ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වේ.

| | විෂයය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | පුස්තකාල විද්‍යාව | 100 යි | පැය 03 යි |
| (ii) | බුද්ධි පරීක්ෂණය | 100 යි | පැය 01 යි |
| (iii) | සාමාන්‍ය දැනීම | 100 යි | පැය 01 යි |

ඉහත විෂයන්ට අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.

### 6.1 පුස්තකාල විද්‍යාව

**(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය**

(අ) පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය, පුරාතන හා නූතන ලෝකයේ ප්‍රධාන පුස්තකාල

(ආ) ලේඛන කලාවේ සහ පොත් ඇතුළු ලේඛන මාධ්‍යන්හි ආරම්භය හා විකශනය.

(ඇ) මුද්‍රණ ශිල්පයේ ආරම්භය, ව්‍යාප්තිය සහ පුස්තකාල හා සමාජ සංවර්ධන විෂය කෙරෙහි බලපෑම්

(ඈ) පුස්තකාල වර්ග

(i) විශේෂ පුස්තකාල

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සංස්ථා ආදී ආයතන ආශ්‍රිත පුස්තකාල, පර්යේෂණ පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්

(ii) ශාස්ත්‍රීය පුස්තකාල

විශ්ව විද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන ආශ්‍රිත පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්

(iii) පාසල් පුස්තකාල

(iv) මහජන පුස්තකාල

(v) පිරිවෙන් පුස්තකාල හා ආරාමික/ ආගමික ආයතන පුස්තකාල

(ඉ) පුස්තකාල කමිටු - ව්‍යුහය, අවශ්‍යතාවය, වැදගත්කම හා කාර්ය භාරය

(ඊ) පුස්තකාල වෘත්තීයට අදාළ විද්වත් වෘත්තීය සංවිධාන හා ඒවායේ කාර්ය භාරය ජාතික හා ජාත්‍යන්තර (ශ්‍රී ලංකාව,ඉන්දියාව,ඇමරිකාව,බ්‍රිතාන්‍ය)

(උ) පුස්තකාල ගොඩනැගිලි - සැලසුම්කරණය, සලකා බැලිය යුතු කරුණු, පවත්නා ගොඩනැගිල්ලක පුස්තකාලයක් ස්ථාපනය, සංවිධානය හෝ වැඩිදියුණු කිරීම.

(ඌ) පුස්තකාල ද්‍රව්‍ය නඩත්තුව, සංරක්ෂණය ( Conservation ) සහ ආරක්ෂණය (Preservation )

(ඒ) ආපදා ( Disasters) සහ ආපදා කළමනාකරණය ( Disaster Management )

**2. දැනුම හා තොරතුරු සංවිධානය**

(අ) ග්‍රන්ථ වර්ගීකරණයේ අරමුණු සහ ප්‍රයෝජන

(ආ) ශ්‍රී ලංකාවේ පුස්තකාලයන්හි භාවිත වන ප්‍රධාන වර්ගීකරණය ක්‍රම.ඩිවි දශම වර්ගීකරණය,විශ්ව දශම වර්ගීකරණය

(ඇ) පුස්තකාල සූචියේ අරමුණු, ඇංග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහය ( AACR ) සම්ප්‍රදාය

(ඈ) ග්‍රන්ථ විස්තරය

(ඉ) AACR 2 සංස්කරණය භාවිත කරමින් ස සංඛ්‍යා ලේඛන සම්පාදනය

**3. පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා**

(අ) විවිධ පුස්තකාල සම්පත්

(ආ) එකතු සංවර්ධනය, එකතු සංවර්ධන ප්‍රතිපත්ති හා එහි වැදගත්කම

(ඇ) පුස්තකාල සම්පත් තේරීම ඇතුළු ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය

(i) පුස්තකාල සම්පත් තේරීමේ මූලධර්ම, මූලාශ්‍ර

(ii) ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය, පිරිමැසුම්කරණය ඇතුළු විවිධ තාක්ෂණික සේවා

(iii) තොග සමීක්ෂණය හා අපහරණ ක්‍රියාවලිය

(ඈ) ප්‍රකාශනය, ප්‍රකාශන හිමිකම හා වාරණය

(ඉ) ප්‍රවර්තන සම්ප්‍රජානන සේවය ( Current Awareness Service )

(ඊ) පාඨක අධ්‍යාපන වැඩසටහන්

(උ) මහජන සම්බන්ධතා හා පුස්තකාල ප්‍රචාරණය

**4. තොරතුරු සන්නිවේදන තාක්ෂණය ( Information Communication Technology )**

(අ) පුස්තකාලවල පරිගණක භාවිතය හා පුස්තකාල සේවාවන් හා කාර්යන් වලදී තොරතුරු තාක්ෂණයේ වැදගත්කම හා ඵලදායීතාවය

**6.2 බුද්ධි පරීක්ෂණය :**

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

**6.3 සාමාන්‍ය දැනුම :**

ජාතික, කලාපීය හා සමස්ථ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුල මෙන්ම අප සමාජය තුල පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාල වෙනත් සාධකයන් සම්බන්ධයෙන්ද පුස්තකාල විෂය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂය සඳහා වෙන්කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් බැගින්වත් ( 40 %) අපේක්ෂකයකු විසින් ලබාගත යුතුවන අතර, විවෘත තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

**සටහන :-**

විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී තිබේනම්, ලිඛිත විභාගයක් නොපවත්වා සම්මුඛ පරීක්ෂණයකින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

**7.0 විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු. 1000/- කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට ( පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතුවේ.

**8.0 අයදුම්පත්‍ර :**

ඒ 4 ( සාමාන්‍ය හාෆ්ෂීට් ) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(අ) අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද,
(ආ) අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුලත් වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් තම අත් අකුරින්ම පැහැදිලිව අයදුම්පත්‍රය පිරවිය යුතුය.
(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසිපරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.1 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා බඳවා ගැනීමේ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය වේ.

8.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2019"** යන්න හා **ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය** සඳහන් කරන්න.

8.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 240,360/- ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2019 ජුනි මස 27** වන දිනට හෝ ඊට පෙර **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**9.0** අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**10.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්**

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**11.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් , ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

2019.06.04 දින
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්
සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නවනගරය, රත්නපුර.

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

*ආදර්ශ අයදුම්පත්‍රය*

**සබරගමුව පළාත් රාජ්‍ය පුස්තකාලයාධිපති සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2019**

# Open Competitive Examination for Recruitment to Grade III Of the Sabaragamuwa Provincial Public Librarians' Service - 2019

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) ☐

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2 දෙමළ - 3
( කොටුව තුළ අදාළ අංකය ලියන්න) ☐

**1.0** 1.1 මුල’කුරු අගට යොදා මුල’කුරු සමඟ නම .......................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A.B.C

1.2 සම්පූර්ණ නම .......................................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම .......................................................................................................
( සිංහලෙන් / දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

**2.0** 2.1 ස්ථිර ලිපිනය .......................................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .......................................................................................

2.2 ස්ථිර ලිපිනය .......................................................................................................
( සිංහලෙන් / දෙමළෙන්) .......................................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය .......................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .......................................................................................

2.4 දුරකථන අංකය - (ස්ථිර/ජංගම) .......................................................................

**3.0** 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය රත්නපුර 1
කෑගල්ල 2 ☐
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ................................ ( කොටුව තුළ අදාළ
3.3 පදිංචිව සිටින කාලසීමාව .................................... අංකය ලියන්න)
3.4 ග්‍රාම නිලධාරී කොට්ඨාශය ....................................

**4.0**

4.1 ස්ත්‍රී/ පුරුෂ භාවය ස්ත්‍රී - 1 ☐
පුරුෂ - 2 ( කොටුව තුළ අදාළ අංකය ලියන්න)

4.2 උපන් දිනය වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

4.3 2019 ජුනි මස 27 වන දිනට වයස අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

**5.0** අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (සහතිකයේ පිටපතක් අමුණන්න)

I .විභාගයේ වර්ෂය හා මාසය :....................................
II. විභාග අංකය :..........................................
III. ප්‍රතිඵල

| **විෂයය** | **ශ්‍රේණිය** | **විෂයය** | **ශ්‍රේණිය** |
|---|---|---|---|
| 1 | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර (සහතිකයේ පිටපතක් අමුණන්න)

I .විභාගයේ වර්ෂය හා මාසය .......................
II. විභාග අංකය ..............................
III. ප්‍රතිඵල

| **විෂයය** | **ශ්‍රේණිය** |
|---|---|
| 1.<br>2.<br>3.<br>4. | |

5.3 විභාග නිවේදනයේ 5.0 (ඇ) ඡේදය ප්‍රකාර මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති පුස්තකාල විද්‍යාව සම්බන්ධ තුන් අවුරුදු ඩිප්ලෝමාව / උපාධිය පිළිබඳ විස්තර : (අදාළ සහතිකයේ පිටපතක් අමුණන්න. )

I . විශ්ව විද්‍යාලය / :.......................................................................................
ආයතනය :...............................................................................................
II. ඩිප්ලෝමාව / උපාධිය :.............................................................................
III. වර්ෂය :..................................................

**6.0** වෙනත් සුදුසුකම් :..............................................................................................................

**7.0** ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
( අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| | | | | |
|---|---|---|---|---|
| ඔව් | | | නැත | |

**8.0** විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :..........................................................................
(ii) ලදුපතේ අංකය හා දිනය :...................................................................................
(iii) ගෙවූ මුදල :.........................................................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

**9.0** අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

....................................... ....................................
දිනය අයදුම්කරුගේ අත්සන

**10.0** අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන.......................................................... මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු / ඇය මා ඉදිරිපිට දී .......................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

.......................................... .......................................................
දිනය සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ නම..................................................

තනතුර.......................................

ලිපිනය........................................

( නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**11.0** රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකයද ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිළධාරියකු විසින් කළ යුතුය.

(අ) මෙම දෙපාර්තමේන්තුවේ...............................................................................................දින සිට ........................................................................................................තනතුරේ සේවය කරන .................................................................................................මහතා/මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට උපයාගත යුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(ආ) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරණ තනතුරෙන් මුදා හැරිය හැකි / නොහැකි බවත් දන්වමි.

.................................................................

නම....................................................... දෙපාර්තමේන්තු ආයතන ප්‍රධානියා හෝ බලය

පදවිය................................................... පවරනු ලබන නිළධාරියාගේ අත්සන

දිනය...................................

දෙපාර්තමේන්තුව/ආයතනය